3. දෙන ලද සරසුලක සංඛ්‍යාතය ($f$) නිර්ණය කිරීම සඳහා ඔබට රූපයේ පෙන්වා ඇති පරිදි ධ්වනිමානයක් සහ එක් $M$ ස්කන්ධයක් සපයා ඇත. දෙන ලද ධ්වනිමානයේ $P$ හි දී විවර්තනය කරන ලද ලීවරයක බාහුවේ ඇති වෙනස් තව්වලින් දෙන ලද ස්කන්ධය එල්ලීමෙන් කම්බියේ ආතතිය වෙනස් කළ හැකි ය. රූපයේ දක්වෙන ආකාරයට 1 සිට 5 දක්වා තව් අංකනය කර ඇති අතර 1, 2, 3, 4, සහ 5 තව්වලට $P$ සිට ඇති දුරවල් පිළිවෙළින් 1.0, 2.0, 3.0, 4.0 සහ 5.0 cm වේ. $P$ සිට කම්බියට ඇති ලම්බක දුර ද 1.0 cm වේ. ස්කන්ධය නිසා කම්බියේ සිදුවන දික්වීම නොසලකා හැරිය හැකි තරම් කුඩා ලෙස පවත්වා ගන්නේ යැයි උපකල්පනය කරන්න.




(a) දෙන ලද සරසුල සමඟ අනුනාද වන ධ්වනිමාන කම්බියේ මූලික අනුනාද දිග ($l$) ඔබ පරීක්ෂණාත්මකව සොයා ගන්නේ කෙසේ ද?

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(b) $l$ සඳහා ප්‍රකාශනයක්, $f$, කම්බියේ ආතතිය ($T$), සහ කම්බියේ ඒකක දිගක ස්කන්ධය ($m$) ඇසුරෙන් ලියා දක්වන්න.

.......................................................................................................

.......................................................................................................

(c) එක් එක් තව්වෙන් $M$ ස්කන්ධය එල්ලා අනුරූප $l$ දිග මනිනු ලැබේ. $n$ වෙනි තව්වෙන් ($n = 1, 2, 3, 4, 5$) ස්කන්ධය එල්ලූ විට කම්බියේ ආතතිය $T = Mgn$ මගින් දෙනු ලැබේ. ඔබ මෙම සම්බන්ධතාවය ලබා ගන්නේ කෙසේ ද?

.......................................................................................................

.......................................................................................................

(d) $Mg, m, f$ සහ $n$ ඇසුරෙන් $l^2$ සඳහා ප්‍රකාශනයක් ලබා ගන්න.

.......................................................................................................

.......................................................................................................

(e) සැලකිය යුතු දික්වීමක් ඇති නොවන ලෙස ධ්වනිමාන කම්බියට දැරිය හැකි උපරිම ආතතිය 54 N වේ. මිනුම් ගැනීමට තව් පහම භාවිත කිරීමට ඔබට ඉඩ සලස්වන $M$ සඳහා තිබිය හැකි උපරිම අගය (kg වලින් ) කුමක් ද?

.......................................................................................................

.......................................................................................................

(f) ධ්වනිමාන කම්බිය සාද ඇති ද්‍රව්‍යයේ ඝනත්වය ඔබට සපයා ඇත. $m$ හි අගය නිර්ණය කිරීම සඳහා ඔබ ලබා ගත යුතු මිනුම, එම මිනුම ලබා ගැනීමට භාවිත කරන මිනුම් උපකරණයත් සමග ලියා දක්වන්න.

(i) ලබා ගත යුතු මිනුම :.......................................................................

(ii) උචිත මිනුම් උපකරණය :.......................................................................

මේ තීරයේ කිසිවක් නො ලියන්න. මෙය පරීක්ෂකවරුන් සඳහා පමණි.

[ හයවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com

මෙම තීරුයේ කිසිවක් නො ලියන්න.

(g) එවැනි පරීක්ෂණයක දී අඳින ලද $n$ එදිරියෙන් $l^2$ ප්‍රස්තාරයක් පහත දී ඇත.




(i) $f$ හි අගය නිර්ණය කිරීම සඳහා ප්‍රස්තාරයෙන් අවශ්‍ය වන රාශියේ සංඛ්‍යාත්මක අගය ලබා ගන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

(ii) $M = 0.5$ kg සහ $m = 2 \times 10^{-3}$ kg m$^{-1}$ නම් $f$ හි අගය ගණනය කරන්න.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................



www.pastpaperlk.com

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com 6

**A කොටස - ව්‍යුහගත රචනා**

01. (a) (i) 0.4 cm සහ 1.0 cm අතර අගයක් **(ලකුණු 01)**

(ii) පහත සඳහන් ඒවායින් ඕනෑම එකක්

* මීටර් කෝදුව * මීටර් භාගය කෝදුව
* මීටර් පරිමාණය * **පුවරුවට ඇඳන ලද** පරිමාණයක් **(ලකුණු 01)**

(iii) ක්ලිපය බුරුල් කර නළය තුළින් වාතය ඇද (ඉවත් කර) **(ලකුණු 01)**
ක්ලිපය වැසීම. **(ලකුණු 01)**

(iv) එකිනෙකට මිශ්‍ර වන ද්‍රව සඳහා ද යොදා ගත හැකි වීම. **(ලකුණු 01)**

(b) (i) $P_w = h_w d_w g - \frac{2T_w}{r} + P_0$

$P_l = h_l d_l g - \frac{2T_l}{r} + P_0$

ඉහත ඕනෑම එක් ප්‍රකාශනයක් **(ලකුණු 01)**

(ii) $h_w d_w g - \frac{2T_w}{r} + P_0 = h_l d_l g - \frac{2T_l}{r} + P_0$ **(ලකුණු 01)**

$h_w = \left(\frac{d_l}{d_w}\right) h_l + \frac{2}{r d_w g}(T_w - T_l)$ **(ලකුණු 01)**

(iii) $T_l$ නිර්ණය කිරීමට : අන්ත : ඛණ්ඩය
$d_l$ නිර්ණය කිරීමට : අනුක්‍රමණය **(ලකුණු 01)**

(iv) උස මැනීමේ භාගික දෝෂය (ප්‍රතිශත දෝෂය) අඩු කර ගැනීමට. **(ලකුණු 01)**

02. (a) පහත සඳහන් ඒවායින් ඕනෑම එකක්. **(ලකුණු 01)**

* දණ්ඩේ P කෙළවරෙහි උෂ්ණත්වය නියතව පවත්වා ගැනීමට.
* පරීක්ෂණය පුරා හුමාලයෙහි උෂ්ණත්වය නියතව පවත්වා ගත හැකි නිසා.
* උෂ්ණත්වය වෙනසක් නොමැතිව, හුමාලය හුමාල ජනකයේ සිට කුටීරයට සංක්‍රමණය කළ හැකි නිසා.

(b) (i) පහත සඳහන් ඒවායින් ඕනෑම එකක් **(ලකුණු 01)**

* ජලය සහිත කැලරිමීටරය මගින් තාපය උරාගන්නා **ශීඝ්‍රතාව,** එයින් තාපය හානිවන **ශීඝ්‍රතාවට** සමාන නිසා.
* දණ්ඩ තුළින් තාපය සන්නයනය වන **ශීඝ්‍රතාව,** ජලය සහිත කැලරිමීටරයෙන් තාපය හානිවන **ශීඝ්‍රතාවට** සමාන නිසා.

සැ. යු : ශීඝ්‍රතාව යන වචනය තිබිය යුතුමය. නැතිනම් ලකුණු නැත.

(ii) (1) ජලය සහිත කැලරිමීටරයෙන් තාපය හානි වන **ශීඝ්‍රතාව** කාලය සමග වැඩි වීම. **(ලකුණු 01)**

(2) පහත සඳහන් ඒවායින් ඕනෑම එකක්.

* දණ්ඩ තුළින් තාපය ගැලීමේ **ශීඝ්‍රතාව** කාලය සමග අඩුවීම.
* ජලය සහිත කැලරිමීටර මගින් තාපය උරාගන්නා **ශීඝ්‍රතාව** කාලය සමග අඩු වීම. **(ලකුණු 01)**

(iii) 60 °C **(ලකුණු 01)**

(c) (i) $R = 0.16\,(60 - 30)$
$= \underline{4.8\ W}$ **(ලකුණු 01)**

(ii) $4.8 = K \times 1.2 \times 10^{-4} \times \frac{40}{0.4}$ **(ලකුණු 01)**
$K = \underline{400\ Wm^{-1}K^{-1}}$ **(ලකුණු 02)**

සැ. යු: $K = 400\ Wm^{-1}K^{-1}$ සඳහා ලකුණු 02 ම ලබා ගැනීමට ඒකකය නිවැරදිව ලිවිය යුතුයි. ($Wm^{-1}\,{}^{\circ}C^{-1}$ ද නිවැරදි ඒකකයකි.)

(d) නැත. පැහැදිලි කිරීම ලෙස පහත සඳහන් ඒවායින් ඕනෑම එකක්. **(ලකුණු 01)**

* දණ්ඩ දිගේ නියත උෂ්ණත්ව අනුක්‍රමණයක් ලබාගත නොහැකි වීම.
* දණ්ඩ දිගේ තාපය ගැලීමේ ශීඝ්‍රතාව නියත නොවීම.
* නොසැලෙන (අනවරත) අවස්ථා තත්ත්වය ලබා ගත හැකි වීම.
* අවසානයේ දී ජලයේ උෂ්ණත්වය 100 °C ට පත් වීම.

03. (a) සේතු දෙක එකිනෙකට හැකි තරම් සමීපයේ තැබීම. **(ලකුණු 01)**

සරසුල කම්පනය කර ධ්වනි මාන පෙට්ටිය මත තබා, සේතු දෙක අතර මැද කම්බිය මත තබා ඇති කුඩා කඩදාසි ආරෝහකය ඉවතට විසි වනතෙක් සචල සේතුව අචල සේතුවෙන් ඉවතට සෙමින් ගෙන යෑම.

**(ලකුණු 01)**

සැ. යු:(a) සඳහා වෙනත් පිළිතුරක් කම්පනය වන සරසුලෙන් නිකුත් වන ස්වරයේ තාරතාවට, **දළ වශයෙන්** සමාන තාරතාවක් කම්බිය මැදින් පෙළ විට ඇසෙන තෙක් කම්බියේ කම්පන දිග සකස් කරන්න. **(ලකුණු 01)**

කම්බියත්, සරසුලත් **එකවර** කම්පනය කර **නුගැසුම් නොඇසෙන** තෙක් කම්බියේ කම්පන දිග සකස් කරන්න. **(ලකුණු 01)**

(b) $\left.\begin{array}{l} V = f\lambda \\ \sqrt{\frac{T}{m}} = f\,2l \end{array}\right\} \quad l = \frac{1}{2f}\sqrt{\frac{T}{m}}$ **(ලකුණු 01)**

(c) **P වටා ඝූර්ණය** ගැනීමෙන්, $T \times 1 = Mg \times n$

$\therefore T = Mgn$

(d) $l^2 = \frac{1}{4f^2} \times \frac{Mgn}{m}$ **(ලකුණු 01)**

(e) $5 \times M \times 10 = 54$

උපරිම $M = \frac{54}{50} = \underline{1.08\ kg}$ **(ලකුණු 01)**

(f) (i) ලබාගත යුතු මිනුම : කම්බියේ විෂ්කම්භය

(ii) උපකරණය : මයික්‍රෝමීටර් ඉස්කුරුප්පු ආමානය **(ලකුණු 01)**

(g) (i) ප්‍රස්තාරයේ අනුක්‍රමණය $= 0.04\ m^2$ **(ලකුණු 01)**

(ii) $\frac{1}{4f^2}\ \frac{Mg}{m} = 0.04$

$\therefore f^2 = \frac{1}{4 \times 0.04} = \frac{0.5 \times 10}{2 \times 10^{-3}}$ **(ලකුණු 01)**

$f = \underline{125\ Hz}$ **(ලකුණු 01)**